චක්‍රලේඛ අංක : 01/2018

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක : 109, මහ වීදිය,
බත්තරමුල්ල.
2018 | 03 | 13 .

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති,
සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

**සමුපකාර සේවකයින් සඳහා 2018 වර්ෂයේ නිවාඩු.**

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ.මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වනු ලැබේ.

1. ජනවාරි - 14 දෙමළ තෛපොංගල් දිනය
2. පෙබරවාරි - 04 ජාතික නිදහස් දිනය
3. අප්‍රේල් - 13 සිංහල හා දෙමළ අළුත් අවුරුද්දට පෙර දිනය
4. අප්‍රේල් - 14 සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය
5. අප්‍රේල් - 30 වෙසක් පුර පසලොස්වක පෝය දිනට පසු දිනය
6. මැයි - 01 ලෝක කම්කරු දිනය
7. නොවැම්බර් - 20 (මිලාද-දුන්-නබි) නබි නායකතුමාගේ උපන්දිනය
8. දෙසැම්බර් - 25 නත්තල් දිනය

02. ඉහත සඳහන් දිනයන්ට අමතරව සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් "සමුපකාරකයින්ගේ දිනය" වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන දිනය ද, රජය විසින් අවස්ථාවෝචිත පරිදි " රජයේ නිවාඩු " දිනයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් ද, සියළුම පෝය නිවාඩු දිනයන් ද නිවාඩු දින වශයෙන් දිය යුතුය. මීට අමතරව, සිය සේවකයින් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළහොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවලට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳ තීරණය කළ හැකිය.

03. 2018 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනයන් නිවාඩු වශයෙන් යොදා ගෙන ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනයක් හෝ දින දෙකම විවෘතව තැබීමටත්, එම දිනවල වැඩකිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියාකරනු ලැබූ විටදී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදවා ගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුළතදී සේවකයින්ට නිවාඩු ලබාදිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක් සමිති ප්‍රාදේශිකයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

04. ඉහත දැක්වූ නිවාඩු දිනවලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 ½ ට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලතදී සේවකයින්ට නිවාඩු වශයෙන් ලබාදිය යුතුය. මීට විකල්පයක් වශයෙන් දෙපක්ෂයේ එකඟතාව ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකිය.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන හා වෙළඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
8. සියළුම සමුපකාර සේවක වෘත්තීය සමිති .